# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,506—1958 අගෝස්තු 29 වැනි සිකුරාද—29.8.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 741 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම ... ... | — |



## පළාත් පාලන නිවේදන

ඇල්. ජී. ඩී—බී. සී 485.

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ විධිවූ බල මණ්ඩලය විසින් එනම්, කට්ටන්කුඩි සුළු නගර සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පවැරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කායර්‍යාංශයේ වැඩබලන ස්ථාවර ලේකම්තැන.

1958 අගෝස්තු 19,
කොළඹදීය.

### නියෝග

1. ආඥාපණතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද මස් පිණිස සතුන් මරණ පොදු ස්ථානය සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා ගේ හෝ එතුමා විසින් බලය පවරන ලද වෙනත් කිසියම් නිලධාරියකු ගේ හෝ භාරයේ තිබිය යුතුය. එකී මස් පිණිස සතුන් මරණ ස්ථානය ඇතුළත මනා පරිපාලනය හා සනීපාරක්ෂක තත්වය සම්බන්ධයෙන් එකී වෛද්‍ය නිලධාරි තුමා හෝ බලය ලත් නිලධාරියා හෝ විසින් වග කිය යුතුයි.

2. (i) කිසිම අයකු විසින් කිසිම සතකු—

(ඒ) සුළු නගර සභාව විසින් ඒ සඳහා පත්කරන ලද සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා විසින් හෝ බලය ලත් නිලධාරියා විසින් හෝ ඒ සතා පරීක්ෂා කොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම සුදුසු යයි අනුමත කර තිබේ නම් ; හෝ

(බී) මනැම දිනක පූ.භා. 6ටත් දවල් 12ටත් අතර කාලයේදී ; හෝ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි ; එහෙත් කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස්වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපතිතුමා විසින් බලය දිය හැකියි.

(ii) කිසිම අයකු විසින් කිසිම සතකු—

(ඒ) (i) වෙනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය තිහක කාලයක් ගත වූවාට පසු කොයියම් වේලාවක ; හෝ

(බී) (i) වෙනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරණ ස්ථානයට අයිති භූමියෙන් පණපිටින් ඉවත් කර ඇත්තේ නම් ;

ඒ සතා නැවතත් පරීක්ෂාකොට මිනිසුන්ට ආහාර පිණිස මැරීම සුදුසු යයි එම ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි.

3. සතුන් මරණ ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා සතුන් මරණ ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකව ලැබීම සඳහා අවශ්‍යවූ සෑම පිළිවෙතක්ම යොදගත යුතුයි.

4. සතුන් මරණ ස්ථානයට යම් සතකු ගෙන එන සෑම අයකු විසින්ම ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතකු 2 වෙනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියහොත් 2 වෙනි නියෝගයේ සඳහන් නිලධාරිතුමා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකියි.

6. සතුන් මරණ සථානයේදී මරණ ලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය 2 වෙනි නියෝගයේ සඳහන්වූ නිලධාරිතුමාගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේනම් එතුමා විසින් ඒ මස් හෝ අතුනුබහන් ආදිය වහාම විනාශකර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වළකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

7. සතුන් මරණ සථානය භාරවූ නිලධාරිතුමා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසුයයි අනුමත කර නැත්තාවූ හෝ 5 වෙනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතකු මැරීමට අවසර නොදිය යුතුයි.

8. (i) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුයයි 6 වෙනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් 2 වෙනි නියෝගයේ සඳහන් වූ නිලධාරිතුමාගේ නියමය යටතේ මිස සතුන් මරණ සථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(ii) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහා ගාත්වලත් පස්සා ගාත්වලත් සතුන් මරණ සථානය භාරවූ නිලධාරිතුමා විසින් '' T. C. කට්ටන්කුඩි '' යන මුද්‍රාව හා '' ඕස්ත්‍රෙලියානු හරක් මස් '' හෝ '' එළුමස් '' හෝ '' මෙරට හරක් මස් '' යන වචනද පිහිටුවා තිබේනම් මිස නැත්නම් සතුන් මරණ සථානයෙන් ඉවත් නොකළ යුතුයි.

9. අනික් සතුන් ඉදිරියේදී හෝ ඒ සථානයෙහි කලින් මරණ ලද යම් සතකුගේ කුණපය ඉවත් කර හෝ මුවා කර, සථානය ශුධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. (i) සතුන් මරණ සථානය පාවිච්චි කිරීම ගැන පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් සුළු නගර සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සුළු නගර සභාවේ කාර්‍යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතකු මැරීමට ඉඩ නොදිය යුතුයි :—

| | රු. ශ. |
|---|---|
| හරකුන් සඳහා එකකුට ... ... | 2 50 |
| බැටළුවන් හෝ එළුවන් සඳහා එකකුට ... | 0 50 |

(ii) මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට සුදුසුයයි 2 වෙනි නියෝගය යටතේ සතකු අනුමත කර තිබෙන විට ඒ සතා මස් මඩුවට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තුව ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් සුළු නගර සභාවේ කාර්‍යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් පෙන්වා සිටීම වුවමනා නො කෙරෙයි.

(iii) කිසියම් සතකු මස් පිණිස මැරීම සඳහා සුදුසු බවට අනුමත කිරීමෙන් පසු මස් මරන සථානයට ගෙනෙනු ලැබූවිට මස් පිණිස සතුන් මරන්නා විසින් ඒ සතා නුසුදුසුයයි ප්‍රතික්ෂෙප කරනු ලැබේ නම් හෝ නොමරා හරිනු ලැබේ නම් හෝ එකී සතා සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ ගෙවන ලද ගාස්තුව සුළු නගර සභාව විසින් ආපසු ගෙවිය යුතුය.

11. සතුන් මරන සථානය භාර අය විසින් සතුන් මරණ සථානයට ගෙන එන ලද සියලුම හරකුන්ගේ රෙජිස්ටරයක් මේ සමග තිබෙන පෝරම යෙහි පරිදි තබා ගත යුතුයි :—

| හරක් කුවිතාන්සියේ නො. | විස්තරය | පාට | වයස | හං නිවරන | | මස්මරන්නාගේ නම | හරක් කොටුවට ඇතුල් කළ වේලාව සහ දිනය | පරීක්ෂාකර බැලූ දිනය | ගෙනගිය දිනය | හරක් පරීක්ෂාකර බලන නිලධාරියාගේ කොට අත්සන | හරක් බාරගන්නා නිලධාරියාගේ කොට අත්සන | වැඩිදුර කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම පැත්ත | | | | | | | |
| | | | | | | | | | | | | |

12. මේ නියෝගවල :—

'' සුළුනගර සභාව '' යනුවෙන් කට්ටන්කුඩි සුළුනගර සභාව අදහස් කෙරේ ;

'' සභාපතිතුමා '' යනුවෙන් කට්ටන්කුඩි සුළු නගර සභාවේ සභාපතිතුමා අදහස් කෙරේ ;

'' සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා '' මඩකලපුවේ සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා අදහස් කරනු ලැබේ.

'' ආඥාපණත '' යනුවෙන් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත (201 වැනි පරිච්ඡේදය) අදහස් කෙරේ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.